

### ජගත් ජේ එදිරිසිංහ

# පිණි

## 5

නිමන්ත නැවත නිවසට ආවේ අමන්දිට දින කීපයක් රෝහලේ නතරවන්නට සිදුවන බව දැනගත් පසුවය. අමන්දි නොමැති නිවස පුරා අරක් ගත් පාලුව දරා සිටිනු නොහැකි තරම් දැඩිව ඔහුට දැනුණි. එකදු වචනයක් නොදොඩා හෝ ඇය මේ නිවස තුළ සිටිය යුතු ය. ඇගේ සුවඳින් මේ නිවස පිරී තිබිය යුතු ය. ඇගේ සුන්දර දසුනින් මේ නිවස ආලෝකමත්ව තිබිය යුතු ය. ඒ සියල්ල නැති සඳ මේ නිවස පාලු කාන්තාරයක් ව ඇතැයි ඔහුට දැනෙයි.

හිස පුපුරා යන තරම් දැඩි වේදනාවක් නිමන්තට දැනුනි.. ඔහු සෝපාවේ ඇල වී තදින් දෑස් පියා ගත්තේ ය. ජංගම දුරකතනයක් නාදවනු ඇසෙයි. ඒ අමන්දිගේ දුරකතනයේ හඬ බව නිමන්ත දනියි. ඔහු මේසය මත වූ ඇගේ අත්බෑගය තුළින් දුරකතනය අතට ගනියි. දුරකතනයේ තිරය මත දිස් වන්නේ සුපුරුදු අංකයක් නොවේ.

"අමන්දි මිස්ට කතා කරන්න පුලුවන් ද..?" දුරකථනය තුළින් තරුණයකුගේ කටහඬක් ඇසුණි.

"අමන්දි නම් නැහැ.. මම නිමන්ත.. අමන්දිගෙ හස්බන්ඩ්.. පණිවිඩයක් තියෙනවා නම් මට කියන්න.." නිමන්ත පිළිතුරු දුන්නේ ය.

"ෂාහ්.." තරුණයා කම්පා විය. "...මට මිස්ට පොඩ්ඩක් කතා කරන්න තිබුණා නම්.."

"ප්‍රශ්නයක් නැහැ මට කියන්න.. මම අමන්දිට කියන්නම්"

"මිස් අද විශ්වජිත් සර් හමුවෙන්න ගියා.. මිස්ට ලොකු ඕනෙකමක් තිබුණානෙ චිත්‍ර ඉගෙන ගන්න.. මගේ කීමටයි ගියේ.. අපේ සර් හරිම අමුතු මනුස්සයෙක්.. සර් කැමති වෙලා නැහැ මිස්ට උගන්නන්න.. අපරාදෙ මං නිසා මිස් අපහසුතාවට පත්වෙන්න ඇති.. මට ඕනෙ මිස්ට සොරි කියලා කියන්න.. මිස්ට කියන්න සුනෙත් කතා කළා කියලා"

"විශ්වජිත්...? ඒ කියන්නෙ විශ්වජිත් බණ්ඩාර ද..? ෆේමස් ආර්ටිස්ට්..?"

"අන්න හරි.."

මෙය අලුත් ආරංචියකි. මේ කිසිවක් තමා නොකීමෙන් අමන්දි කර ඇත්තේ වරදකි. ඇය මේ තරම් හිතුවක්කාර ලෙස කටයුතු කරනු ඇතැයි නිමන්ත කිසි විටෙක නොසිතුවේ ය. කෝපයත් කළකිරීමත් මුසු වූ හැඟීමක් නිමන්තගේ සිත වසා ගත්තේ ය.

"හොඳයි සුනෙත්.. හවසට හොස්පිට්ල් ගියාම මං පනිවිඩේ කියන්නං" ඔහු සිය හැඟීම් වසංගා ගනිමින් කීවේ ය.

"හොස්පිට්ල්...?" අනෙක් කෙළවරේ සිටි තරුණයා වික්ෂිප්තව අසනු නිමන්තට ඇසුණි. ".. ඇයි..? මිස්ට සනීප නැද්ද..?"

සුනෙත් ගේ ප්‍රශ්නයට පිලිතුරක් දෙනු වෙනුවට නිමන්ත කල්පනාවකට වැටී සිටියේ ය. මො-හොතක නිහැඬියාවකට පසු ඔහු කටහඬ අවදි කළේ ය.

"සුනෙත්.. මට ඔයාව ටිකක් හමුවෙන්න ඕනෙ.. මේක වැදගත් දෙයක්.."



00000

අහස මේ තරම් නිල් පැහැයෙන් දිදුලනු තමා කිසි දිනෙක දැක නැතැයි කවුළුව තුළින් බලා සිටිනා අමන්දිට සිතුණි. ඒ නිල් පැහැ පසුබිම මතින් සෙමින් පාව යන සුදු වළා පෙළ ඇගේ සිතේ ඇති කළේ සන්සුන් බවකි. භාවනාවක යෙදී සිටින්නාක් මෙන් රෝහල් ඇඳ මත සිට එදෙස බලා සිටින්නට ඇයට හැකිය. සියල්ල සන්සුන් ය. නිහඬතාව විසින් පරිසරය ගිල ගනු ලැබ ඇත. ඒ නිහඬතාව සිතට සහනයකි. දසත දුවන සිත එකතැනක රඳවාගෙන සන්සුන් වන්නට මේ පරිසරය ඇයට ඉඩ දෙයි.

"..අමන්දි, ඔයා මේ අසනීප තත්වය ගැන ඔය තරම් කල්පනා කරන්න එපා. හිත සැහැල්ලුවෙන්, සතුටින් තියා ගන්න. නියම වෙලාවට බෙහෙත් ටික ගන්න.. විශ්වාසයෙන් වැඩ කරගෙන යන්න.. හැම දේම හොඳින් සිද්ධ වෙයි .. වෛද්‍යවරයෙක් විදිහට මට තියෙන අත්දැකීම් වලින් මම කියන්නේ.. හිතට කරන්න පුළුවන් දේ බොහොමයි. මනෝවිද්‍යාව බොරු නෙමෙයි ළමයා.. බෞද්ධ දර්ශනය කියන්නෙත් ඒ ටික නේද...??" වෛද්‍යවරයා දයාබර පියෙකු මෙන් ලෙන්ගතුව අමන්දි ට කීවේ උදෑසන ඇය පරීක්ෂා කරන්නට පැමිණි වේලාවේදී ය. ඔහුගේ නිවුණ තැන්පත් ස්වභාවය අමන්දිගේ සිතේ සැනසීමක් ඇති කරන්නට සමත් විය. විසිර යමින් තිබුණ ශක්තිය එක්තැන් කරන්නට ඒ වදන් වලට හැකි විය.

අමන්දි ඔහුට ස්තුති කළා ය.

කිසිවකු කාමරයේ දොර අරිනු ඇසෙයි. අමන්දි තදින් දෑස් පියා ගත්තාය. මේ මො-හොතේ කිසිවකු හා කතා කරන්නට හෝ කිසිවකු දකින්නට හෝ ඇගේ සිතේ සතුටක් නැත. ඇයට අවශ්‍ය වූයේ ඈත පාව යන වලාකුළු දෙස නිවී සැනසිල්ලේ බලාසි-ටින්නට පමණකි.

සීතල අතක් තම නළල මත තැන්පත් වනු අමන්දිට දැනුණි. ඇස් පියාගෙන සිටියද ඒ අම්මාගේ අත බව අමන්දි හඳුනාගත්තා ය. ඇය දෑස් පියාගත්වන ම අම්මාගේ අත මත තම අත තැබුවා ය. අම්මා හූල්ලන හඬ ඇයට ඇසුණි. අම්මාගේ සුසුම් තම කම්මුල මත පතිත වනුද ඇයට දැනුණි.

"..මට දැන් සනීපයි අම්මා..." අමන්දි මිමිණුවා ය. අම්මා කිසිවක් නොකියා ඇගේ හිස සෙමින් අතගෑවා ය. ජනෙල් කවුළුවෙන් ඈත බලා සිටිනා තාත්තා දෑස් ඇර බැලූ අමන්දි පළමුව දුටුවා ය. ඔහුගේ මුහුණ හරිහැටි නොපෙනුණ ද ඔහු මහත් කම්පාවකින් සිටින්නේයයි අමන්දි සිතුවා ය. තාත්තාට මදක් ඈතින් සිටගෙන සිටි නිමන්ත දෙස නොබලා සිටින්නට අමන්දි උත්සාහ ගත්තා ය.

" ටික දවසකට ඔය දෙන්නා අපේ ගෙදර ඇවිත් ඉන්න.." අප්පච්චි බොහෝ වේලාවකට පසුව කීවේ ය.

මේ වෙලාවෙ හැටියට එය වඩාත් හොඳ යෝජනාවක් යයි නිමන්තට සිතෙයි. එයට එකඟ විය යුතු ය. ඔහු අමන්දි දෙස බැලුවේ ඇගේ අදහස දැනගනු රිසියෙනි.